# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2467/41 - 2025 දෙසැම්බර් මස 16 වැනි අඟහරුවාදා - 2025.12.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී -5/1991

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත**

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 68 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාදනු ලබන සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

**වරුණ ශ්‍රී ධනපාල**
සභාපති,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

2001 මැයි මස 03 වැනි දින අංක 1182/12 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2001 අංක 1 දරන විකුණුම්කරුගේ බලපත්‍ර (විදුලි සංදේශ උපකරණ) රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 4 වන රීතියේ, "පනත" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“ "පනත" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත අදහස් වේ;”;

සහ

(2) එකී රීතිවල උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන්:-

"උපලේඛනය

| අංකය | I වන තීරය<br>කාර්යය, ක්‍රියාව හෝ කාර්ය හෝ ක්‍රියා සංකලනය | II වන තීරය<br>වර්ෂයකට ගාස්තුව | |
|---|---|---|---|
| | | කර්මාන්තශාලා හෝ වෙළඳසැල් දහයක් (10) දක්වා | කර්මාන්තශාලා හෝ වෙළඳසැල් දහයකට (10) වඩා වැඩි |
| 1 | වෙළඳාමක් වශයෙන් විදුලි සංදේශ උපකරණ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, විකිණීම හෝ විකිණීම පිණිස ඉදිරිපත් කිරීම | එක් කර්මාන්ත ශාලාවක් හෝ වෙළඳසැලක් සඳහා රු. 6,000.00 | එක් කර්මාන්ත ශාලාවක් හෝ වෙළඳසැලක් සඳහා රු. 3,000.00 |
| 2 | වෙළඳාමක් වශයෙන් විදුලි සංදේශ උපකරණ පැවරීම, කුලියට දීම, බදු දීම හෝ ක්‍රියාකර පෙන්වීම | එක් වෙළඳසැලක් සඳහා රු. 3,000.00 | එක් වෙළඳසැලක් සඳහා රු. 1,500.00 |
| 3 | වෙළඳාමක් වශයෙන් විදුලි සංදේශ උපකරණ නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම | එක් වෙළඳසැලක් සඳහා රු. 3,000.00 | එක් වෙළඳසැලක් සඳහා රු. 1,500.00". |

EOG 12 - 0065

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.